සරම්ප (Measles) රෝගය පැතිරීම වැළැක්වීම සම්බන්ධව

ශ්‍රී ලංකාව 2019 වර්ෂයේදී සරම්ප රෝගය තුරන් කළ රටක් ලෙස සහතික කරනු ලැබුවද, මේ වන විට මෙරටින් සරම්ප රෝගීන් හයදෙනෙකු (06) තහවුරු වී ඇති බව වාර්තා වී ඇත.

සරම්ප යනු ඉතා වේගයෙන් පැතිර යා හැකි රෝගයකි. විශේෂයෙන් දේශන ශාලා, නේවාසිකාගාර, ආපනශාලා සහ වෙනත් ජනාකීර්ණ ස්ථානවල මෙම රෝගය පහසුවෙන් පැතිර යා හැකිය. තවද, නියුමෝනියාව, මොළයේ ආසාදන වැනි බරපතළ සංකූලතා මෙන්ම ඇතැම් අවස්ථාවල මරණය පවා සිදුවිය හැකි බැවින් මේ පිළිබඳව සියලු දෙනාගේ විශේෂ අවධානය යොමු විය යුතුය.

සරම්ප රෝගයේ ප්‍රධාන රෝග ලක්ෂණ

- අධික උණ
- රතු පැහැති පැල්ලම් සහිත සමේ කුෂ්ඨ (බිබිලි නොවන)
- කැස්ස,සෙම්ප්‍රතිශ්‍යාව,ඇස් රතුවීම

ඉහත රෝග ලක්ෂණ පවතී නම්, පහත උපදෙස් අනුගමනය කරන්න.

- දේශන, නේවාසිකාගාර ආශ්‍රිත පොදු කටයුතු සහ සායනික පුහුණු කටයුතු සඳහා සහභාගී වීමෙන් වළකින්න.
- මුහුණු ආවරණයක් පළඳින්න. වෛද්‍ය උපදෙස් ලබා ගැනීම සඳහා වෛද්‍යවරයකු හමුවන්න. හැකි නම්, රෝහලට හෝ වෛද්‍ය මධ්‍යස්ථානයට යාමට පෙර දුරකථනයෙන් දැනුම් දෙන්න.
- නේවාසිකාගාරයේ රැඳී සිටින සිසුන් තම උපශාලාධිපතිවරයා/වරිය දැනුවත් කරන්න.
- වෛද්‍ය උපදෙස් ලැබෙන තුරු අනෙකුත් පුද්ගලයන්ගෙන් වෙන්ව සිටින්න.
- සරම්ප එන්නත් ලබාගෙන ඇති බව තහවුරු කරගන්න.

වයස අවුරුදු 20–30 අතර සියලුම සිසුන් තම එන්නත් වාර්තා පරීක්ෂා කර සරම්ප එන්නතේ නිර්දේශිත මාත්‍රා දෙකම ලබාගෙන ඇති බව තහවුරු කරගන්න. එන්නත් ලබාගෙන ඇති බව තහවුරු කළ නොහැකි නම් හෝ එන්නත් මාත්‍රා සම්පූර්ණ කර නොමැති නම්, ඒ සම්බන්ධයෙන් වෛද්‍ය උපදෙස් ලබාගන්න.

වෛද්‍ය මධ්‍යස්ථානය/ රුහුණ විශ්වවිද්‍යාලය
19.11.2026